පස්සෙ කතාව සර් දන්නවා.."

"ඒග්සෑම්ස්...?"

"මං ෆයිනල්ස් මගේ උපරිමයෙන් ලිව්වා.. කොහොම හරි මට හොඳට ලකුණු තිබුණා.. මන්දා.. සමහරවිට සූරියබණ්ඩාරලා මට වැඩියෙන් ලකුණු දෙන්න ඇති.. මං ඒක ගැන හෙව්වෙ නැහැ.. මං ක්ලාස් එකක් එක්ක උපාධිය අරගෙන විශ්ව විද්‍යාලයෙන් එළියට බැස්සෙ ඩ්‍රග්ස් වලට ඇබ්බැහි වෙලා මානසිකවත් ශාරීරිකවත් පිරිහිච්ච කෙල්ලක් හැටියට.."

විදුල සුසුමක් හෙලුවේ ය. සිය සිත බොහෝ සෙයින් කම්පනයට පත්ව ඇති සැටි ඔහුට දැනුණි. යමක් කියන්නට අවශ්‍ය වූ නමුදු ඒ සඳහා අවශ්‍ය වචන එක් රැස් කරගන්නට නොහැකිව ඔහු මද වේලාවක් නිහඬව සිටියේ ය.

"අතීතය හරිම කුරිරුයි තමයි... ඒත් මේ හැම අද්දැකීමක්ම ඔයාගෙ අනාගත ජීවිතයට ශක්තිමත් පදනමක් වෙයි මදාරා" ඔහු කීවේ ය. මදාරා සිනාසුණා ය.

"ජීවිතේට අලුතෙන් මූණ දෙන්න මං සූදානම් සර්.. මං හෙට ගෙදර යන්නෙ මගේ පරණ අම්හිරි දේවල් ඔක්කොම මේ කාන්තා නිවාසෙ බිත්ති හතර ඇතුළෙ තියල... දිග ගමනක් යන්න මං ලෑස්තියි.. පහළට නෙවෙයි.. ඉහළට.. ගොඩක් ඉහළට.."

00000000000

"ෂොපින් යනවද වින්ඩෝ ෂොපින් යනවද..?" ප්‍රශ්නය නැගුණේ පසුපසින් ය. නිරාෂා හැරී බැලුවා ය. සමදරා හිනැහෙමින් තමා වෙත එනු ඇය දුටුවා ය.

නිශ්චිත යමක් මිලට ගැනීමේ අරමුණකින් තොරව ඉඳ හිට දවසක මැජෙස්ටික් සිටියට ගොඩවන්නට නිරාෂා පුරුදුව සිටියා ය. අද ආවේ ද යමක් මිලට ගැනීමේ අරමුණකින් නොවේ. වෙනසකට ය. එහෙත් මේ මොහොතේ සමදරා මුණගැසේයයි ඇය නිකමට හෝ නොසිතුවා ය.

මදාරා ගේ පැනයට පිළිතුරක් දීමට නොසිතා නිරාශා බලා සිටියා ය.

"ඇමතිතුමා එක්ක මීටිමක් තිබුණා.. ඉක්මණින් ඒක ඉවරවුණ හින්ද මාත් ඔහේ සාප්පු සවාරියෙ ආවා.." සමදරා කීවේ නිරාශාට මුහුණලා නැවතෙන අතර ය. "..මොකද තනියම..? කෝ අද විදුල ..?" නිරාශා ගේ දෑතම අල්ලා ගන්න අතර ඇය තවත් ප්‍රශ්න දෙකක්ම ඇසුවා ය.

"විශේෂ හේතුවකට ආවා නෙවෙයි සාමා.. මං කම්මැළිකමට පොඩ්ඩක් ඇවිදින්න ආවා.. විදුල එන්න කලින් ගෙදර යන්නත් ඕනෙ.." නිරාශා කීවා ය.

"මං යම්ං ගමන ඔයාව ඩ්‍රොප් කරන්නං.. අපි ඉස්සෙල්ල මොනා හරි බීල ඉමු.." සමදරා කීවා ය.

"..විදුල කිව්වද මං ඊයෙ පෙරේද දවසක ඇමතිතුමාගෙ වැඩක් ගැන එයාට කතා කළා කියලා..?" ඇය නැවත ඇසුවේ ආපන ශාලාවේ රවුම් මේසය ඉදිරියේ නිරාශාට මුහුණ ලා වාඩි වන අතර ය.

නිරාෂා සිනාසුණා ය.

"කිව්ව.."

"වැඩේ කෙරෙයි ද?"

නිරාශා පිළිතුරක් නොදී මද වේලාවක් බලා සිටියා ය. සමදරා ගේ යෝජනාව සම්බන්ධව විදුල තමා සමග උපහාසයෙන් කතා කළ ආකාරය ඇයට මතක ය.

"කලා නිර්මාණයක් කියන්නෙ මොකක්ද කියලවත් මේ මිනිස්සුන්ට තේරෙන්නෙ නැහැ නී.. මට දුක සාමා වගේ මාව හොඳටම දන්න කෙනෙක් ඔය වගේ යෝජනාවක් අරගෙන ආව එක ගැනයි.." විදුල කීවේ ය.

"එයා ඔයාට හොඳක් කරන්න හදනවා වෙන්න බැරි ද..? එයා දන්නවනෙ අපට තියෙන ආර්ථික ප්‍රශ්න.."

"ප්‍රශ්න තියෙන බව හැබැයි.. ඒත් තුට්ටු දෙකේ ඇමතිකෙනෙක්ගෙ තුට්ටු දෙකේ ව්‍යාපෘතියකට කර තියලා සල්ලි අරගෙන මගේ ප්‍රශ්න විසඳගන්න මට කිසිම ඕනෙ කමක් නෑ.."

සමදරා මේසය හරහා සිසිල් බීම වීදුරුව නිරාශා දෙසට තල්ලු කළේ ඇගේ දෑහැණ බිඳ දමමිනි. නිරාශා ප්ලාස්ටික් බටයෙන් රතු පැහැති දියරය කූරු ගාමින් මොහොතක් ගත කළා ය.

"මං හිතන්නෙ නෑ සාමා විදුල ඔයාගෙ යෝජනාවට කැමති වෙයි කියලා... ඔයා විදුලගෙ හැටි දන්නවනේ.. යාලුවගෙ හැටි මං ආයෙ අමුතුවෙන් කියල දෙන්න ඕනෙ නැහැනෙ.." අනතුරුව ඈ කීවා ය.

සමදරා සැහැල්ලුවෙන් සිනාසුණා ය.

"යෝජනාව කරනකොටම මං දැනගෙන හිටිය ඌ කැමති වෙන්නෙ නැති බව.. ඒත් නිරාශා මේක ඉල්ලමක් වගේ දෙයක්.. මේක පාදාගන්න කියල මං කියන්නෙ පුද්ගලික සුඛවිහරණයට නෙවෙයි.. තමන්ට හොඳයි කියලා හිතෙන වෙනත් ඕනෙම සත් කාර්යයකට මේක පාවිච්චි කරන්න පුලුවන් නිසා.. අපි නොකළොත් වෙනින් කවුරු හරි එකෙක් අනිවාර්යයෙන්ම මේක ඩැහැ ගන්නවා.. එහෙම වෙනවට වඩා මං කියන දේ හොඳ නැද්ද..?"

"විදුල හිතන්නෙ අපි හුඟක් අය හිතන විදිහට නෙවෙයි.. එයා වෙනස්... එයා අසම්මත මිනිහෙක් කියලා සමහර මිනිස්සු එයාට පහර ගහන්නෙත් ඒක තේරුම් ගන්න බැරි නිසයි.. මම විදුල නං ඔයා කියන දේට එක පයින් කැමති වෙන්න තිබුණා.. ඒත් විදුලට ජීවිතේ ගැන තියෙන්නෙ වෙනම දැක්මක්.. කලාව ගැන තියෙන්නෙ වෙනම භාවිතාවක්.."







සමදරා හිස් වීදුරුව මත ඇඟිල්ලෙන් ඉරි අඳිමින් බලා සිටියා ය.

"උත්සාහ කරල බලන්න.. එයාගෙ අදහස් වෙනස් කරගන්න ඔයාට පුලුවන් වෙයි.. ඒක ඔය දෙන්නගෙම අනාගතයට හොඳයි නේද?" ඈ කිවේ වීදුරුව දෙස නෙත් යොමාගත්වනම ය.

"මේ තියෙන හොඳ හොඳටම ඇති සාමා.. අපි දෙන්නටම අනිත් හුඟක් අයට තියෙනවා වගේ අහස අල්ලන්න බලාපොරොත්තුවක් උත්සාහයක් නැහැ.. අපි ගොඩක් සතුටින් ඉන්නෙ.. විදුල කවදාවත් මගේ ජීවිතේට ඇඟිලි ගැහුවෙ නැහැ.. මාත් එහෙමයි.." නිරාශා මේසය හරහා සමදරා දෙස මොහොතක් බලා සිටියා ය. "..මං බැඳපු අසම්මත මිනිහා හැමදාම ඒ අසම්මත මිනිහා වෙලාම ඉන්නවට මං කැමතියි සාමා.."

**මතු සම්බන්ධයි**




# Idol

**Your idol could be a celebrity**
**Or your dad that drives to the city**
**Or maybe even that girl in your class**
**That's stops and lets everyone pass**
**Is it that character from the book you read**
**That helped the world starting with a seed**
**Even the man that gave a speech at your school**
**About when he was angry how he kept his cool**
**An idol is someone big or small**
**Does not matter short or tall**
**An idol is someone that has helped you in some way**
**Or make you look at the world differently starting today**
**So tell me today who is your idol?**

The dictionary definition for idol is a person or thing that is greatly admired, loved, or revered so who is your idol? Is it Spiderman or Batman that risk their lives to save people, or is it your parents who were with you since the day you were born. Maybe it's a celebrity who fought to succeed or maybe even that young girl you saw that helped the old lady across the road. Your idol can vary in shape and size, living or not and in how much they inspire other people. So before you tell me who your idol is let me tell you a few possibilities to what kind of person they might be.

Most people think that an idol should be someone famous and this is the case for many of us. Most of us look at very famous people to be our idol like Obama or Beyonnce, maybe sports stars that have made it to the top of the leader or even inspirational speakers that have a story of endurance. Someone that may be you idol is Steve Jobs who created Apple and used to work at Pixar, after all his hard work he finally became known for something, he never gave up on his idea and now it is a million dollar company. Or is it Jeff Yalden a motivational speaker that has changed thousands of teenager's lives. Either way in the public's eyes their every move can be seen and what they do could inspire someone to change themselves for the better.

Maybe your idol could be someone that does not exist. Like a fictional character from a movie or book you read. Some people think that Harry Potter is an inspirational character because he is brave and stands up for his friends, while others like Willy Wonka because of his humour and personality. Your idol does not have to be a living person they can be a fictional character that warms your heart with every word or changes the world so people can have a brighter future.

The person that you look up to does not have to be someone famous; they could even be your crossing lady. Idol means someone you admire, why can't you admire that teacher that always buys stuff with her own money to educate the students better because the school can't afford it. Or even the shopkeeper that is always is happy and greets everyone with a friendly smile. Your Idol does not have to make the front cover of the magazine or have a thousand dollar mansion, they could just be on a street busking for their pay.

My Idols are my parents because I have known them since the day I was born and I will remember them till the day that I die. They have made me the person that I am today and showed me how to look at life correctly; they told me that if I work hard then good things will happen to me. They put me on the correct path and taught me right from wrong. They worked hard to accommodate me with the life that I am living and never asked me anything in return. They always listened to my problems and gave me answers that I could use every day. They want me to have a good future and they do everything that they can to make sure that this happens. I will not ever be able to thank them for what I have done. They have inspired me to treat others properly and always look at life optimistically; because they have taught me important life lessons they are my idols.

So now tell me, who is your idol? Maybe you have decided to pick someone famous or a person from your favourite novel, maybe it is even that old lady that gives you a warm smile whenever you pass her. Maybe your idols are your parents as well, because they are who made you the way you are today. Our idols help us want to reach a goal, or look at life in a better way, they might even just make you smile or given you something that you cannot thank them enough for. Your idol must mean something to you and today I hope that you have realised who that is.







